සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 40 | S | I |
|---|---|---|---|---|

## පෙරදිග සංගීතය

**කාලය පැය එකයි**

සැලකිය යුතුයි :- ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
● ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. සප්තකයෙහි ඇති චල ස්වර ගණන
(1). 2 කි. (2). 4 කි. (3). 5 කි. (4). 7 කි.

02. මගමරි, ගපධනිස් ආදී වශයෙන් ස්වර සංගති යෙදෙන රාගය වනුයේ,
(1). යමන් (2). බිලාවල් (3). කාෆි (4). භූපාලි

03. ග-ධ සහ ධ-ග වාදී සංවාදී වන රාග යුගලය පිළිවෙලින්,
(1). බිලාවල්- භූපාලිය. (2). භූපාලි - යමන්ය. (3). යමන් - බිලාවල්ය. (4). භූපාලි - බිලාවල්ය.

04. භෛරවී රාගයට අදාළ වන ප්‍රකාශය තෝරන්න.
(1). රාත්‍රී කාලයෙහි ගැයෙන රාගයකි. (2). සර්ව කෝමළ රාගයකි.
(3). පංචමය සහ ධෛවතය වාදී සංවාදී වේ. (4). සරිමපධ යන ස්වර අනුවාදී වේ.

05. රාත්‍රී ප්‍රථම ප්‍රහරයෙහි ගැයීමට සුදුසු නිර්දේශිත රාග යුගලය වනුයේ,
(1). යමන් - භූපාලි (2). කාෆි - භෛරවී (3). බිලාවල් - භූපාලි (4). යමන් - කාෆි

06. මධ්‍යමය සහ සඩ්ජය වාදී සංවාදී වන රාගය වන්නේ,
(1). කාෆි (2). බිලාවල් (3). භෛරවී (4). යමන්

07. සරි ගප ගරි සරි / ගපධස් ධප ගරි
සරි රිග ගප ධප / ගප ගරි ගරි ස -

ඉහත සඳහන් තානාලංකාරය අයත් රාගය වනුයේ,
(1). යමන් (2). භූපාලි (3). බිලාවල් (4). කාෆි

08. සර්ව කාලීනව ගැයීමට සුදුසු රාගය වන්නේ,
(1). යමන් (2). කාෆි (3). භූපාලි (4). භෛරවී

09. නිර්දේශිත රාග අතුරෙන් ඖඩව ජාති රාගය වන්නේ,
(1). කාෆි (2). භූපාලි (3). යමන් (4). භෛරවී

10. භෛරවී රාගයෙහි වාදී සංවාදී ස්වර වනුයේ,
(1). ස ම (2). ප ස (3). ම ස (4). ස ප

11. මාත්‍රා ගණනින් සහ යේකාවෙන් සමාන වන තාල යුගලය වන්නේ,
1. ජප් තාල් - දීප් චන්දි 2. කෙහෙර්වා - ලාවනී
3. දාදරා - බෙම්ටෝ 4. ත්‍රිතාල් - කෙහෙර්වා

12. සුළු මැදුම් දෙතිතට හා මැදුම් මහ දෙතිතට සමාන හින්දුස්ථානී තාල යුගලය පිළිවෙලින්,
1. ජප් තාලය - දීප්චන්දි 2. දීප්චන්දි - ලාවනී
3. ජප් තාලය - ත්‍රිතාල් 4. ලාවනී - කෙහෙර්වා

13. ධ ම ධ නි ස් - ස්ස් ආදී වශයෙන් අන්තරා ආරම්භ වන රාගය වන්නේ,
(1). කාෆි (2). භෛරවී (3). යමන් (4). භූපාලි

14. ම ම ප ධ / නි නි ස් - ස් / කාෆි රාගයට අනුව මෙහි නි ස්වරය හඳුන්වන්නේ,
(1). විකෘති ස්වරය ලෙසයි. (2). වර්ජිත ස්වරය ලෙසයි.
(3). අනුවාදී ස්වරය ලෙසයි. (4). විවාදි ස්වරය ලෙසයි.

15. දිනයේ ප්‍රථම ප්‍රහරයෙහි ගැයෙන රාගය වන්නේ,
(1). බිලාවල් (2). යමන් (3). කාෆි (4). භූපාලි

16. භෛරවී රාගයෙහි යොදා ගනු ලබන විවාදී ස්වර වන්නේ,
(1). රි ග ධ නි (2). රි ග ම ධ නි (3). රි ග ම් ධ නි (4). රි ග ප ධ නි


17. සස රිරි ග ග මම / පම ගම ගරි ස - / ලෙස තානාලංකාර යෙදෙන රාගය වන්නේ,
(1). යමන් (2). කාෆි (3). භෛරවී (4). බිලාවල්

18. තබ්ලා බායාං හි නිකුත් කරන "ගෙ" අක්ෂරයත්, දායාං හි නිකුත් කරන "තා" අක්ෂරයත් එකවර වාදනය කිරීමෙන් උපදින අක්ෂරය වන්නේ,
(1). ධිං (2). ධෙන් (3). ධා (4). දිං

19. " කලණ මේල ගත පිරුණු නිස ගැයෙන " යන ලක්ෂණ ගී පාදයෙන් කියවෙන රාග ලක්ෂණ වන්නේ,
1. කල්‍යාණ මේල ගත සම්පූර්ණව ගැයෙන රාගයක් බවය.
2. කල්‍යාණ මේල ගත සම්පූර්ණ නිසා ගැයෙන රාගයක් බවය.
3. කල්‍යාණ මේල ගත ෂාඩව නිසා ගැයෙන රාගයක් බවය.
4. කළණ මේල ගත සම්පූර්ණ රාගයක් මෙන්ම රාත්‍රී කාලයේ ගැයෙන රාගයක් බවය.

20. තබ්ලාවේ දහිනා කොටසෙහි අක්ෂර උත්පාදනය කරගනු ලබන්නේ,
1. ලවය, මෛදාන් සහ ස්‍යාහි යෙනි. 2. චාන්ටි, ලවය සහ ස්‍යාහියෙනි.
3. ස්‍යාහි, චාන්ටි සහ ගජරා වෙනි. 4. චාන්ටි, ස්‍යාහි සහ බද්ධි වලිනි.

❖ **පහත සඳහන් රූපය ඇසුරින් 21 සිට 24 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




21. භූපාලි රාගයෙහි අවරෝහණයට අදාළ ස්වර වලට හිමි අංක වන්නේ,
(1). 13, 10, 8, 5, 3, 1 (2). 1, 3, 5, 6, 10,13 (3). 13, 10, 6,5, 3, 1 (4). 1, 3, 5, 8, 12, 13

22. ස රි ග ම යන ස්වර 4 මධ්‍යම භාවයෙන් වාදනයේදී උපයෝගී කරගනු ලබන යතුරු වලට හිමි අංක වනුයේ,
(1). 6, 8, 9, 12 (2). 6, 8, 10, 11 (3). 6, 10, 12, 13 (4). 6, 8, 11, 12

23. F minor Chord එකට වාදනය කළ යුතු යතුරු වලට හිමි අංක වන්නේ,
(1). 6, 7, 10 (2).6, 9, 13 (3). 6, 8, 12 (4). 6, 10, 13

24. C minor Scale එකට අයත් යතුරු වලට හිමි අංක වන්නේ,
(1). 1, 2, 5, 6, 8, 9, 10, 12 (2). 1,3, 5, 6, 8, 10, 12, 13
(3). 1, 2, 4, 6, 8, 9, 11, 12 (4). 1, 3, 4, 6, 8, 9 සහ 11, 13

25. "රතු හැට්ටකාරී" නාට්‍යයේ එන ගීයකි.
1. සෝබාවදේ මෙපුර 2. යස ඉසුරු පිරුණු 3. අපි කිරිල්ලියෝ 4. රතදර සිරියා පරදන

26. කෝකිල වන්නම ගායනා කරනු ලබන්නේ,
1. මැදුම් තනි තිත හා දෙසුළු මැදුම් තුන්තිත අනුවය. 2. මැදුම් තනි තිත හා සුළු මැදුම් දෙතිත අනුවය.
3. මැදුම් මහ දෙතිත හා දෙසුළු මැදුම් තුන් තිත අනුවය. 4. මැදුම් මහ දෙතිත හා සුළු මැදුම් දෙතිත අනුවය.

27. බෙර පදය, තානම, කවි හා ඉරට්ටිය වශයෙන් කොටස් හතරකට බෙදෙනුයේ,
1. උඩරට වන්නම් වලය. 2. පහතරට සින්දු වන්නම් වලය.
3. සබරගමු වන්නම් වලය. 4. උඩරට ප්‍රශස්ති වලය.

28. "මනමත් කරවන දනමුළු දෙරණා" මෙම පැදි පාදයේ එන සඳැස්මත් ගණන කීයද?
1. 15 කි 2. 14 කි 3. 13 කි 4. 16 කි

29. "ගම අවුලක්ෂද්දං, මේ අවුරුදු කාලේ සහ වන්නම් සවුදම්" ආදී ජන සංගීත ආශ්‍රිත ගීත නිර්මාණය කළේ,
1. සී.ද.එස්. කුලතිලක මහතාය. 2. ලයනල් රංවල මහතාය.
3. රෝහණ බැද්දගේ මහතාය. 3. ඩබ්.බී. මකුලොලුව මහතාය.

30. සී.ද.එස්. කුලතිලක මහතා විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් නොවන්නේ,
1. ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය 2. විශ්ව සංගීත ක්ෂේත්‍ර
3. හෙළ ගී මඟ 4. ජන සංගීත සිද්ධාන්ත

❖ 31 සිට 34 දක්වා ප්‍රශ්න වලට පහත සඳහන් රූප සටහන් උපයෝගී කරගන්න.


A


B


C


D


E

31. ප්‍රධාන තත් 7 කින් යුතු සංගීත භාණ්ඩය වන්නේ,
    1. D ය.  2. C ය.  3. B ය.  4. A ය.

32. B සංගීත භාණ්ඩයේ තත් නම් කරනුයේ,
    1. G, D, E, A, B, E ලෙසය.  2. G, D, A, E ලෙසය.
    3. E, A, D, G, B, E ලෙසය.  4. G, A, B, E ලෙසය.

33. C සංගීත භාණ්ඩයේ සිහින් තතේ සිට මහත තත දක්වා නම් කරනුයේ,
    1. E ,A, D , G, B, E ලෙසය.  2. G, B, E, D, A, E ලෙසය.
    3. E, B, G, D, A, E ලෙසය.  4. D, A, E, G, B, E ලෙසය.

34. E සංගීත භාණ්ඩයේ වාදනය කරනු ලබන වාද්‍ය අංග වන්නේ,
    1. කායදා, මුඛඩා, පරන්, චක්‍රධාර්ය  2. කායදා, පරන්, ජලා, මුඛඩාය.
    3. කායදා, පල්ටා, ජලා, පරන්ය  4. කායදා, පරන්, ස්ථායි, ජලා ය.

35. මුල් යුගයේ චිත්‍රපට සංගීත අධ්‍යක්ෂවරයෙකු නොවන්නේ,
    1. මොහොමඩ් ගවුස් ය.  2. එඩී ජයමාන්න ය.
    3. ආර්. මුත්තුසාමි ය.  4. ආනන්ද සමරකෝන් ය.

36. රේඛාව චිත්‍රපටයේ එන ගීයකි,
    1. රන් වන් දුල් කරලින්  2. මනරංජන දර්ශනීය
    3. ආදර නදිය ගලා  4. වෙසක් කැකුළු අතු

37. Magnitude යනුවෙන් බටහිර සංගීතයේ දී හඳුන්වන්නේ නාදයේ කවර ගුණය ද?
    1. නාදයේ උස් පහත් බව යි.  2. රූප භේදය යි.
    3. උච්ච නීච භේදය යි.  4. ධ්වනි ගුණය යි.

38. නාඩගම් සඳහා භාවිතා වන්නේ කුමන තාල වාද්‍ය භාණ්ඩය ද?
    1. තබ්ලාව  2. මද්දලය  3. යක් බෙරය  4. මෘදංගය

39. සංගීතමය නාද කිසියම් විද්‍යුත් අංකිත ක්‍රමයකට හුවමාරු කිරීමේ ක්‍රමය හඳුන්වනුයේ,
    1. E - music ය.  2. Sound Forge ය.  3. Modem ය.  4. Midi ය.

40. සංගීත නිර්මාණ කිරීම සඳහා බහුලව භාවිත කරන මෘදුකාංගයකි.
    1. Acid pro  2. Cubase  3. Adobe Audition  4. Pro tools

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 | 40 S II

පෙරදිග සංගීතය | කාලය පැය දෙකයි

★ පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(01) අංක i සිට iv දක්වා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

i. බිලාවල් රාගයෙහි අනුවාදී ස්වර ලියන්න.
ii. නිරිග, රිග, පරි ආදී වශයෙන් ස්වර සංගති යෙදෙන රාගය නම් කරන්න.
iii. ලාවනී සහ ජප් තාලයෙහි දෙවන අනුතාලය පිහිටන්නේ කුමන මාත්‍රාව මතද?
iv. "කවුරුදෝ අර කවුළුවෙන්" යන ගීතය නිර්මාණය කර ඇත්තේ කුමන රාගයක් ආශ්‍රය කරගෙනද?

❖ අංක v සිට viii දක්වා අසා ඇති ප්‍රශ්නවල හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර ප්‍රශ්න අංකයද සමඟ ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

v. "අන්දර යායේ වැව් තාවුල්ලේ" යන පියගුණ ගීතය ගායනා කරනු ලබන්නේ ................................................ යන් විසිනි.
vi. ඉදිරියටා යමු සැවොමා, සිරි දරු හෙලදිව යන මනරම් ගී ඇතුළත් වනුයේ .................................... චිත්‍රපටයේය.
vii. ඇම්.ඇස්. ප්‍රනාන්දු සහ ඇන්ටන් ජෝන්ස් වැනි ගායකයින් ................................................ ගීත ශෛලියෙන් ගීත ගැයුවෝය.
viii. කොහිනූර්, බෛජුබව්රා, ජනක් ජනක් පායල් භාජේ ආදී හින්දි චිත්‍රපට හි සංගීතය .......................................... පසුබිමකින් යුක්ත සංගීත නිර්මාණයන් දැකිය හැකිය.

❖ ප්‍රශ්න අංක ix සහ x හි හිස්තැන් සඳහා සුදුසු පිළිතුර ප්‍රශ්න අංකයද සමඟින් ඔබේ පිළිතුර පත්‍රයෙහි ලියන්න.

ix. රාජ කපුරු නාට්‍යය ........................................... නිෂ්පාදනයක් වන අතර එහි ගැයෙන ............................................ යන ගීතය ජනප්‍රිය නාට්‍ය ගීයකි.

x. ජර්මනියේ "බොන්" නුවරදී උපත ලැබූ ............................................ ළමා වියේ දීම අති දක්ෂ පියානෝ වාදකයෙකි.
ඔහු ........................, .................................. යන සංගීතඥයාගෙන් ද ශිල්ප හදාරා ඇත. ( ලකුණු 12කි)

(02) පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග තුනකට අයත් විස්තර වේ.,

A - කල්‍යාණ මේලයෙන් උපදී
ධෛවතය සංවාදී ස්වරයයි.

B - කල්‍යාණ මේලයෙන් උපදී
නිශාදය සංවාදී ස්වරයයි.

C - මධ්‍යම රාත්‍රියෙහි ගැයීමට සුදුසුය.
සඩ්ජය සංවාදී වේ.

i. ඉහත A,B සහ C රාග පිළිවෙලින් නම් කරන්න. ( ලකුණු 3කි)

ii. ඉහත රාග තුනට අදාළව ගන්ධාර ස්වරය වැදගත් වන අයුරු රාග නාමය ඉදිරියේ සඳහන් කරන්න. (ලකුණු 3කි)

iii. ඉහත රාග තුනෙන් පංචමය වාදී වන රාගයෙහි, මධ්‍යලය හෝ ලක්ෂණ ගීතයේ ස්ථායී කොටස නියමිත තාල සංඥා සමඟ ස්වර ප්‍රස්තාර කරන්න. ( ලකුණු 6කි)

(03) නිර්දේශිත රාග දෙකක ස්වර සංකේත නොමැතිව ස්වර සංගති දක්වා ඇත.

A - මග, සරිස, ධනිස B - ගරි, ගප, ධනිස

i. A සහ B යන රාග දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. ඉහත ස්වර ඛණ්ඩ නිවැරදි ස්වර සංකේත සමගින් නැවත ලියා දක්වන්න. (ලකුණු 02)

iii. ඉහත රාග දෙකෙන් එක් රාගයකට අදාළව මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාර 2 ක් ලියන්න. (1x2 ලකුණු 02)

iv. සඩ්ජය සංවාදී ස්වරය වන රාගයෙහි මධ්‍යලය හෝ ලක්ෂණ ගීතයේ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

v. සුළු මැදුම් දෙතිතට සමාන හින්දුස්ථානි තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. ( ලකුණු 02 )

(04) i. අනාඝාතාත්මක පැදි යන්න හඳුන්වන්න. ( ලකුණු 02 )

ii. විනෝදාස්වාදය හා සමාජ අවශ්‍යතා මත ගොඩනැගුණු ගී පිළිබඳව හඳුන්වා, එම කරුණු දෙක සඳහා සුවිශේෂ ගීත දෙකක් උදාහරණයට දක්වන්න. ( ලකුණු 04 )

iii. සබරගමු වන්නම් පිළිබඳ සුවිශේෂ කරුණු 4 ක් ලියා දක්වන්න. (ලකුණු 04 )

iv. ඔබ උගත් පහතරට වන්නමක කවියෙහි පළමු පාදය නියමිත තිත අනුව පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 02 )

(05) i. නාඩගම් සංගීතයට අදාළව සුවිශේෂ කරුණු 4 ක් සඳහන් කරන්න. (ලකුණු 04 )

ii. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ගීතය | ආශ්‍රය කරගත් රාගය | තාලය |
|---|---|---|
| සවන් දී පෙර රාම චරිතේ අසව් | | |
| | කාෆි | |
| අප ගුණසරු සිංහල භූපති | | |

(ලකුණු 1/2x6 =3 )

iii. "සවන්දී පෙර රාම චරිතේ අසව්" යන ගී පාදය නියමිත තාලය අනුව පද ප්‍රස්තාර කරන්න. ( ලකුණු 02 )

iv. මනමේ, සිංහබාහු, කාලගෝල යන නව නාට්‍යයන්හි නිෂ්පාදකවරු, ගීත හා යොදාගත් සංගීත භාණ්ඩ පිළිබඳව තොරතුරු ඇතුළත් වගුවක් සකස් කරන්න. (ලකුණු 03 )

(06) පහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරය ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට අනුව ස්වර ප්‍රස්තාර කරන්න. ( ලකුණු 03 )

ii. ඉහත ස්වර ප්‍රස්තාරයේ a,b,c,d වශයෙන් ලකුණු කර ඇති අපරදිග ස්වර සංකේත සඳහා භාවිත නාමයන් ලියන්න. (ලකුණු 02 )

iii. පෙරදිග ක්‍රමය අනුව ප්‍රස්තාර කරන ලද ප්‍රස්තාරයේ පළමු විභාග හතරට අයත් ස්වර, පංචම භාවයට පෙරළා නැවත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

iv. F major scale හා F minor scale පෙරදිග ක්‍රමය අනුව ලියා දක්වන්න. (ලකුණු 03)

(07) පහත සඳහන් මාතෘකා අතුරෙන් 3 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. කපිරිඤ්ඤා ගීත 2. සේ ගී 3. ඩබ්.බී. මකුලොලුව

4. ධ්වනි ගුණය 5. හරිප්‍රසාද් චෞරසියා (ලකුණු 4x3=12 )

# තෙවන වාර පරීක්ෂණය - 2019

පෙරදිග සංගීතය

පිළිතුරු පත්‍රය

11 ශ්‍රේණිය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) -3 | (6) -3 | (11) -2 | (16) -3 | (21) - 1 | (26) - 1 | (31) - 4 | (36) - 4 |
| (02) -2 | (7) -2 | (12) -1 | (17) -2 | (22) - 2 | (27) - 2 | (32) - 2 | (37) - 2 |
| (03) -4 | (8) -4 | (13) -2 | (18) -3 | (23) - 2 | (28) - 4 | (33) - 3 | (38) - 2 |
| (04) -2 | (9) -2 | (14) -4 | (19) -4 | (24) - 4 | (29) -2 | (34) - 1 | (39) - 4 |
| (05) -1 | (10) -3 | (15) -1 | (20) -2 | (25) - 2 | (30) - 3 | (35) - 2 | (40) - 2 |

## II කොටස

(01) i. ස රි ම ප නි
ii. යමන්
iii. 3
iv. භෛරවී
v. කරුණාරත්න දිවුල්ගනේ
vi. සැඩසුලං
vii. බයිලා කපිරිඤ්ඤා
viii. රාගධාරී
ix. ජනක් ප්‍රේමලාල් / සුවඳ සබන් ඇඟ ගාලා
x. ලූඩ් විග්වෑන් බීතෝවන් / මෝසාට් හෝ හෙයිඩ්න් ( ලකුණු 12)

(02) i. A - භූපාලි
B - යමන්
C - කාෆි(ල. 03)

ii. භූපාලි - ගාන්ධාරය වාදී ස්වරයි.
යමන් - ගාන්ධාරය වාදී ස්වරයි.
කාෆි - ගාන්ධාරය කෝමළ වේ. (ල. 03)

iii. කාෆි රාගයේ මධ්‍ය ලය හෝ ලක්ෂණ ගීතයේ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කිරීමට (ල. 06)

(03) i. A - භෛරවී
B - බිලාවල් (ල. 02)

ii. භෛරවී - මගු, සරිස, ධ නිස
බිලාවල් - ගරි, ගප, ධනිසं (ල. 02)

iii. භෛරවී හෝ බිලාවල් රාගයේ මුඛඩාව ලියා තානාලංකාර දෙක ලිවීමට (ල. 1x2=2)

iv. භෛරවී රාගයෙහි මධ්‍යලය හෝ ලක්ෂණ ගීතයෙහි ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කිරීමට. (ල. 04)

v. ජප් තාලය

| x | 2 | o | 3 |
|---|---|---|---|
| 1 2 | 3 4 5 | 6 7 | 8 9 10 |
| ධී නා | ධී ධී නා | තී නා | ධී ධී නා |

( ල. 2)

(04) i. ආඝාතයට නොපෙලඹෙන අයුරින් පද සංයෝග වු පැදි අනාඝාතාත්මක පැදි වේ. පාද සතරෙහි මත් කැටිවීම හා ආඝත ලක්ෂණ විවිධ වු පැදි ආනාඝාතාත්මක පැදිවේ යනුවෙන් කරුණු ගොනුකොට තිබිය යුතුය (ල. 02)

ii විනෝදාස්වාදය සඳහා ගැමියා ක්‍රීඩාවන්හි යෙදී ඇත. එම ක්‍රීඩා සමග ගැයෙන ගී කෙළි ගී නමින් හැඳින්වේ. උදාහරණ - ඔළිඳ කෙළිය, මේවර කෙළිය, පනා හැංගීම, අං කෙළිය ආදී කෙළි ගී වලින් එකක් ලියා තිබීම.

සමාජ අවශ්‍යතා මත ගොඩනැගුණු ගී සඳහා දරු නැළවිලි ගීත ගත හැකිය.
උදාහරණයට නැළවිලි ගී ලියා තිබීම. (ල. 04)

iii. ❖ රත්නපුර, කලවාන, කුරුවිට, පැල්මඩුල්ල, නිවිතිගල, හීදැල්ලන, බලංගොඩ ආදී සබරගමු පළාතට ආවේණික නැටුම් සම්ප්‍රදායේ එන වන්නම් සබරගමු වන්නම්ය.

❖ දෙවියන් හා සතුන් පිළිබඳ වර්ණනා ඇතුළත් ගීත විශේෂයකි.

❖ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය දවුලයි.

❖ සබරගමු වන්නමක දී දවුල් පදය, තානම, කවිය, කලාසම, අඩව්ව වශයෙන් කොටස් පහකි.

❖ නාමිකව සබරගමු වන්නම් 24 ක් වුවත් භාවිතයේ පවතින්නේ 18 කි.

❖ එය සංස්කරණ කරන ලද්දේ කලවානේ ධර්මාලංකාර අතපත්තු මුදලිය ආදි..... ලෙස කරුණු ගොනුකොට තිබිය යුතුය. (ල. 04)

iv / සේ s s / වි s ත s /පා s s/ද s ස s/
/ රො s s/ රු s හ s /ස න් s/ජී s ත s/ (ල. 02)
/+ + + /යෙ න් ඉ s/තා s s/s s s s /
/ s s s / s s s s /s s s /s s s s/

(05) i. ❖ කර්ණාටක රාගධාරී සංගීතය පදනම් වීම.

❖ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය මද්දලය වීම.

❖ පොතේ ගුරු හා වෙනත් චරිත ගයන ගී පාදවලට අත්වැල් ගායක කණ්ඩායම සහය ගායනය ඉදිරිපත් කිරීම.

❖ සර්පිනාව, හොරණෑව, තාලම්පට වාදනයෙන් සහය කර ගැනීම.

❖ බොහෝ ගීතවල "උරුට්ටුව" නමින් කොටසක් ඇතුළත් වීම..........
ආදී ලෙස කරුණු 4 ක් තිබීම (ල. 04)

ii.

| ගීතය | ආශ්‍රය කරගත් රාගය | තාලය |
|---|---|---|
| සවන් දී පෙර රාම චරිතේ අසව් | බිලාවල් | දීප්චන්දි |
| රකිණු ඊශ්වරා | කාෆි | දාදරා |
| අප ගුණසරු සිංහල භූපති | භෛරවී | කෙහෙර්වා |

(ල. 1/2x6=3)

iii. ස/ව න් s / දී s s s /පෙ ර s /රා s ම s/
/ ච රි s/තේ s අ s/ස ව් s /s s s s/ (ල. 02)

iv.

| නාට්‍ය | නිෂ්පාදක | ගීත | සංගීත භාණ්ඩ |
|---|---|---|---|
| මනමේ } සිංහබාහු | මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර | ප්‍රේමයෙන් මන/ දුලා නෙතු පුලා/ ගල්ලෙන බිඳලා | සර්පිනාව , මද්දලය, බටනලාව<br>සර්පිනාව , මද්දලය, බටනලාව |
| කාලගෝල | පුන්‍යසේන ගුණසිංහ | | |

(ල. 03)

(06) i. / සරි ග රිග/ ප ගරි ස / - සග රි/සනි ධ නි /
/ ස - - / - ග ම / ප ධ ප / ම ග රිග/ (ල. 03)

ii. a - Treble clef
b - Time Signature
c - Tie mark
d - Dotted minim (ල. 02)

iii. පධ නි ධනි / රි නිධ ප / - පනිධ / පම් ගම් /

iv. ම ප ධ නි ස් රි ග් ම් - F major Scale (ල. 04)

ම ප ධ නි ස් රි ග් ම් - F minor Scale (ල. 03)

(7) ඕනෑම මාතෘකා 03ක් පිළිබඳව සුවිශේෂී කරුණු ඇතුළත් කොට කෙටි සටහන් ලියා තිබි යුතුය. (ලකුණු 4x3=12)